


**ඔබත් සාර්ථක ව්‍යවසායකුද?**

රටක විවිධ පාරිසරික හා සමාජ තත්ත්වයන් යටතේ ව්‍යවසායකයන් බිහිවීම සහ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය වන අතර ව්‍යවසායකයා පිළිබඳ වැදගත් නිර්වචන කිහිපයක් පහත දැක්වේ.

**ව්‍යවසායකයා යනු**

- ව්‍යවසායකයා අවධානම් දරන්නෙකි (Risk Taker) - Cantillon - 1775
- ව්‍යවසායකයා සංවිධායකයෙකි (Organizer) - ව්‍යවසායකයා නිෂ්පාදන සාධක සංයෝග කරනු ලබන ආර්ථික නියෝජිතයෙකි. නැතිනම් සංවිධායකයෙකි - J B Say
- ව්‍යවසායකයා නවෝත්පාදන සිදුකරන්නෙකි (Innovator) - ව්‍යවසායකයා යනු නවෝත්පාදන තුලින් ලාභ උපරිම කිරීමට උත්සාහ කරන ආර්ථික මිනිසෙකි - J A Schumpeter – 1991
- ව්‍යවසායකයා නිතරම වෙනසක් සොයන ඊට ප්‍රතිචාර දැක්වීමෙන් එය තමන්ගේ වාණිජමය අවස්ථාවක් බවට පත්කර ගන්නෙකි - Peter Drucker

රටක සමෘද්ධිය උදෙසා ඉහත ආකාරයට ක්‍රියා කිරීම ව්‍යවසායකත්වය වන අතර, නවෝත්පාදන සිදුකිරීම, සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, රැකියා ජනනය, පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීම, ආදායම් උත්පාදනය වැනි කරුණු නිසා ව්‍යවසායකයාට රටක හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානය වැනි රටවල් ලෝක ආර්ථිකයේ බලවතකුවීමේ රහස ව්‍යවසායකත්වයයි. එසේම වර්තමානයේ සංවර්ධිතභාවයට පත්වී ඇති කොරියාව ,මැලේසියාව, සිංගප්පූරුව, හොංකොං වැනි රටවල්වල සාර්ථකත්වයෙහි රහස ව්‍යවසායකත්වය පිළිබඳව වැඩි නැඹුරුවකින් කටයුතු කිරීම වේ.

**මේ ගුණාංග ඔබට තිබේද?**

| | |
|---|---|
| ✓ | **වෙහෙසවී වැඩ කිරීම-**ව්‍යාපාරයක් කරගෙන යාමට විශාල වශයෙන් ශක්තිය සහ උනන්දුව අවශ්‍ය වේ. මෙයට අවශ්‍ය විටදී වැඩි පැය ගණනක් වැඩ කිරීමට ඇති හැකියාව, දැඩි උත්සාහයකින් විශාල වශයෙන් වැඩ කිරීමේ හැකියාව ඇතුලත් වේ. |
| ✓ | **ආත්ම විශ්වාසය-**ව්‍යවසායකයින් ඔවුන් ගැන සහ ඔවුන් විසින් පිහිටවන ලද ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා ඔවුන් සතු හැකියාව ගැන විශ්වාස කල යුතුය. ඔබට යම් දෙයක් අවශ්‍ය නම් එය ලබා ගැනීම සඳහා ක්‍රියාකිරීමට සූදානම් ඔබට සාමාන්‍යයෙන් එය ලැබෙනු ඇත යන මතයක් පවතී. |
| ✓ | **අනාගතය සඳහා ගොඩනගා ගැනීම -** ඔවුන්ගේ හැකියාවන් පදනම් කරගනිමින් ඔවුන් වෙනුවෙන් සුරක්ෂිත රැකියාවක් සහ ආදායම් මාර්ගයක් ගොඩනගා ගැනීම වඩා සාර්ථක ව්‍යාපාරික පුද්ගලයන්ගේ අභිමතාර්ථය වේ. ව්‍යාපාරයක ආදායම සැලකිය යුතු තත්ත්වයකට ගෙන ඒමට |

| | |
|---|---|
| | වසර කිහිපයක් ගත වන බව ව්‍යවසායකයින්ට යම් අවබෝධයක් ඇති බව මින් අදහස් කෙරේ. |
| ✓ | **ලාභයට නැඹුරු -** මුදල් උපයා ගැනීමට ඇති උනන්දුව, ව්‍යාපාරයක හිමිකරුවෙකු වීමට ව්‍යවසායකයෙකු සතු සුදුසුකම පැහැදිලිව පෙන්නුම් කිරීමකි. ව්‍යාපාරයට මුල් තැන දිය යුතු බව හඳුනාගැනීම මෙයින් අදහස් කෙරේ. ලාභ උපයා ගැනීමෙන් පසු එම ලාභය භාවිතා කරන්නේ කෙසේද? ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා හෝ පෞද්ගලික භාවිතය සඳහාද යන්න ව්‍යවසායකයාට තීරණය කළ හැක. |
| ✓ | **ඉලක්ක නැඹුරු -** යථාර්ථවාදී අරමුණු හෝ ඉලක්කයන් ස්ථාපිත කිරීම සහ ඒවා කරා ලඟාවීමට අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කිරීම මත ව්‍යාපාරයක සාර්ථකත්වය රඳා පවතී. ඉලක්කයන් ස්ථාපිත කිරීමට (පුද්ගලයෙකු වටිනා යයි සිතන දේවල්) සහ ඒවා කරා ලඟා වීමට ක්‍රියාකිරීමට ඇති මෙම හැකියාව, ව්‍යවසායකයෙකු වීමේ මූලික අවශ්‍යතාවයක් වේ. |
| ✓ | **නොපසුබට උත්සාහය -** ගැටළු සහ බලාපොරොත්තු කඩවීම සෑම ව්‍යාපාරයකම පවතී. ගැටළු විසඳීමේදී උත්සාහවන්තවීම සාර්ථක ව්‍යවසායකයෙකු වීමට ප්‍රධාන හේතුවකි. |
| ✓ | **අසාර්ථකවීම දරාගත හැකිවීම -** සෑම ව්‍යාපාරයකම බලාපොරොත්තු කඩවීම් සහ අසාර්ථකවීම් එමෙන්ම සාර්ථක වීම් ද නියත වශයෙන් පවතී. අසාර්ථකවීම් හඳුනාගැනීම, ඒවායින් ඉගෙන ගැනීම සහ නව අවස්ථාවන් සොයා ගැනීම, අසාර්ථකවීම් දරා ගැනීමෙහි ඇතුලත් වේ. මෙම ලක්ෂණ නොමැති වුවහොත් සිදුවන්නාවූ මුල්ම අසාර්ථකවීම් මගින්ම ස්වයං රැකියාවක් කිරීමට යම් පුද්ගලයෙකු ගන්නා උත්සාහයන් නිමාවේ. |
| ✓ | **ප්‍රතිචාරවලට ප්‍රතික්‍රියා දැක්වීම -** ඔවුන් කෙතරම් සාර්ථකව කරගෙන යනවාද කියා දැන ගැනීමට සහ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩව කරගෙන යාමට වයවසායකයින් සැලකිලිමත් වේ. අන් අයගේ වටිනා ප්‍රතිචාරයන් සහ අවවාද ලබා ගැනීම ව්‍යවසායකයෙකු සතු තවත් වැදගත් ලක්ෂණයකි. |
| ✓ | **මූලාරම්භයන් ප්‍රදර්ශනය කිරීම -** සාර්ථක ව්‍යවසායකයෙකු මූලාරම්භයන් ලබා ගන්නා බව සහ සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට පෞද්ගලිකව වග කියන බවට ඔවුන් පත්වන බව පර්යේෂණ වලින් පෙන්නුම් කර ඇත. |
| ✓ | **සවන්දීමට කැමති බව -** සාර්ථක ව්‍යවසායකයෙකු ඇතුලත පමණක් බලන විට එමෙන්ම, බාහිර සම්පත් කිසිවක් භාවිතා නොකරන්නාවූ පුද්ගලයෙකු නොවේ. ස්වයං රඳාපැවැත්ම මගින් අවශ්‍ය විටකදී බැංකු නිලධාරීන්, ගණකාධිකාරීන් සහ ව්‍යාපාරයක් සඳහා උපදෙස් දෙන්නන් වැනි පුද්ගලයින්ගෙන් උපකාර ඉල්ලීමට ඇති හැකියාව බැහැර නොකරයි. වෙනත් පුද්ගලයින්ගේ අවවාද වලට සවන් දීමට ඇති හැකියාව ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන ලක්ෂණයකි. |
| ✓ | **තමාගේම තත්වයන් ස්ථාපිත කිරීම -** තමන්ගේ ක්‍රියාකාරකම් සඳහා තත්ත්ව මට්ටම් ස්ථාපිත කිරීම සහ ඒවා ඉටුකර ගැනීමට ක්‍රියාකාරීව සාර්ථක ව්‍යවසායකයෙකු හුවා දැක්වීමකි. මෙම තත්ත්ව මට්ටම් ආදායම, ගුණාත්මක බව, වෙළඳාම සහ නිෂ්පාදන පිරිවැටුම විය හැක. බොහෝ ව්‍යවසායකයන් හට සෑම වර්ෂයකදීම වඩා හොඳින් කිරීම සහ වර්ෂයක් වර්ෂයක් පාසා උසස් තත්ත්ව මට්ටම් ස්ථාපිත කිරීමට සහ ඒවා ඉටු කර ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය වේ. |
| ✓ | **අවිනිශ්චිත තත්ත්වයන් දරා ගත හැකි බව -** ව්‍යවසාකයකයෙකු වීම රැකියාවක යෙදීමට වඩා අවිනිශ්චිත වේ. මෙම අවිනිශ්චිත තත්ත්වය බොහෝ දුරට පවතින්නේ පිරිවැටුම මත නමුත්, ද්‍රව්‍ය ප්‍රවාහනය සහ මිල ගණන්, බැංකු සහාය වැනි වෙනත් ක්ෂේත්‍ර වලද මෙය නිරන්තරව පවතී. වැඩි ආතතියකින් තොරව අවිනිශ්චිත තත්ත්වන් දරා ගැනීමට ඇති හැකියාව, ව්‍යවසායකයෙකු වීමට අවශ්‍ය විශේෂ ලක්ෂණයකි. |
| ✓ | **කැපවීම -** ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම, කාලය, මුදල් සහ ජීවන රටාව වැනි කරුණු වල ව්‍යවසායකයෙකුගේ පූර්ණ කැපවීම මත සිදුවේ. මෙය ව්‍යවසායකයෙකු ජීවිතයේ ප්‍රමුඛතම ස්ථානයක් ගත යුතුය. |

**ශක්තිය මත ගොඩනැඟීම -** ඔවුන් සතු දැතේ හැකියාවන්, අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමේ හැකියාවන්, විකුණුම් හැකියාවන්, සංවිධානය කිරීමේ හැකියාවන්, ලිවීමේ දක්ෂතාවයන්, විශේෂ නිෂ්පාදනයක් හෝ සේවාවක් සම්බන්ධ දැනුම, රක්ෂණයක යෙදී සිටින පුද්ගලයින් ගැන දැනුම සහ සම්බන්ධකම් ජාලයක් ගොඩනඟා ගැනීමට සහ භාවිතා කිරීමෙහි හැකියාව වැනි ශක්තීන් මත සාර්ථක ව්‍යාපාරික පුද්ගලයින් ඔවුන්ගේ වැඩ ගොඩනඟා ගනී.

**විශ්වාසනීයත්වය සහ අවංකභාවය-** පොරොන්දු ඉටු කිරීම හා සම්බන්ධ අවංකත්වය, සාධාරණත්වය සහ විශ්වාසනීයත්වය වැනි ගුණාංග ව්‍යවසායකයෙකු හට අත්‍යවශ්‍ය ගති ලක්ෂණයන්ය.

**අවදානම් දැරීම -** ව්‍යවසායකයෙකු වීම යම් ප්‍රමාණයකට අවදානමකි. ව්‍යවසායකයින් හට ගණනය කළ අවදානම් තත්ත්වයන් දැරීමට හැකියාවක් ඇත. විය හැකි වියදම් සහ ආදායම් ගණන් බැලීම, සාර්ථක විමේ හැකියාව සහ අවදානමින් මිදීම සඳහා පුද්ගලයෙකු කෙරෙහි විශ්වාසය තැබීම මෙවැනි අවදානම් තත්ත්වයන්ට අයත් වේ. වෙනත් අයට අවදානම් තත්ත්වයන්ගෙන් අඩක් බාර ගැනීමට සලස්වා ව්‍යවසායකයින් තමන්ගේ අවදානම් අඩු කර ගන්නා බැවින්, ඔවුන් අවදානම් මඟ හරින්නන් ලෙස ඇතැම් විට සලකනු ලැබේ. බැංකුකරුවන්, සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයන් ව්‍යවසායකයින්ගේ අවදානම් බාරගන්නා අය විය හැකිය.

**මෙම කුසලතා වලින් ඔබ පරිපූර්ණද?**

- ස්වයං මෙහෙයවීම
- විමර්ශනශීලි බව
- අන් අය සමඟ සබඳතා ගොඩනඟා ගැනීම
- විශේෂිත වූ හැකියාවන්
- නිර්මාණශීලිව කටයුතු කිරීම
- නායකත්වය

එසේ නම් ඔබ සාර්ථක ව්‍යවසායකයෙකු වේ.

| ව්‍යවසායක වර්ගය | කෙටි විස්තරයක් |
|---|---|
| ආරම්භක ව්‍යවසායකයින්.<br>Start-up entrepreneurs | නව ව්‍යාපාර අරඹන ව්‍යාපාරකයින් |
| ව්‍යාපාරයක් අත්පත් කරගෙන එය මෙහෙයවන ව්‍යවසායකයින්<br>Acquisition entrepreneurs | පෙර පැවති ව්‍යාපාරයක් මෙහෙයවන ව්‍යවසායකයින්, |
| වෙනත් ව්‍යාපාරයක් අනුගමනය කරමින් ව්‍යාපාර කරන ව්‍යවසායකයින්<br>Replicative entrepreneurs | දැනට පවත්නා වෙනත් ව්‍යාපාර පිටපත් කරමින් නව ව්‍යාපාර අරඹන ව්‍යවසායකයින් |

| | |
|---|---|
| ඩිජිටල් ව්‍යවසායකයින්<br>Digital entrepreneurs | සිය ව්‍යාපාරයෙහි ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගන්නා ව්‍යවසායකයින්. |
| කාන්තා ව්‍යවසායකයින්<br>Women entrepreneurs | මෙම ව්‍යවසායකයින් කාන්තාවන්ය. ඔවුන්ට වෙනස් වූ අභියෝග වලට මුහුණ දීමට සිදුවේ. |
| හරිත ව්‍යවසායකයින්<br>Green entrepreneurs | පරිසරය හා සම්බන්ධ ව්‍යාපාරික අවස්ථාවන් මුල්කරගෙන ව්‍යාපාරවල නියුතු වන ව්‍යවසායකයින් |

**ව්‍යවසායකත්වයේ වැදගත්කම**
**Importance of entrepreneurship**

- රැකියා උත්පාදනය – Employment creation
- දේශිය සම්පත් භාවිතය –Utilize local resources
- ව්‍යාපාරය විමධ්‍යගත කිරිම සහ ව්‍යාපාර විවිධාංගිකරණය lsrsu – Decentralization & diversification of business
- තාක්ෂණය ප්‍රවර්ධනය – Promotion of technology
- අරමුදල් රැස්කිරිම – Capital formation
- ව්‍යවසායක සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරිම – Promotion of an entrepreneurial culture